# මාධ්‍ය නිවේදනය

**<u>මෝටර් වාහන අනතුරු මගින් තුන්වන පාර්ශවීය වින්දිතයන්ට සිදු වන මරණ හෝ ස්ථිර අබලතා සඳහා වන්දි ලබාගත හැකි විකල්ප ක්‍රමවේදය</u>**

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, ප්‍රවාහන ක්ෂේත්‍රයට සම්බන්ධ අනෙකුත් පාර්ශවකාර ආයතන හා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර මෝටර් වාහන අනතුරුවලට මුහුණපාන තුන්වන පාර්ශවීය වින්දිතයන්ට හෝ ඔවුන්ගේ නීත්‍යානුකූල උරුමකරුවන්ට අධිකරණ ක්‍රියාදාමයකින් තොරව රුපියල් ලක්ෂ පහක (රු. 500,000/-) උපරිමයකට යටත්ව වන්දි ලබාදීමේ විකල්ප ක්‍රමවේදයක් 2024 මාර්තු 01 වන දින සිට ආරම්භ කර ඇත. මෙම නව ක්‍රමවේදය ක්‍රියාත්මක වුවද දැනට පවතින නීති පද්ධතිය යටතේ වන්දි ලබා ගැනීමට ඇති අයිතියට කිසිදු බලපෑමක් සිදු නොවන අතර, ලියාපදිංචි සාමාන්‍ය රක්ෂණ ආයතන විසින් සානුකම්පිත පදනම යටතේ මෙම වන්දි ලබාදීම සිදු කරනු ලැබේ.

**මෙම ක්‍රමවේදය යටතේ වන්දි ලබා ගැනීමට සුදුසුකම් ලබන්නේ කවුරුන්ද?**
මෝටර් වාහන අනතුරකින් මරණයට හෝ ස්ථිර අබලතාවයකට පත්වන පදිකයින් සහ පාපැදිකරුවන් මේ යටතේ සුදුසුකම් ලබයි. වැඩිදුර විස්තර සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කළ 2024 අංක 3 දරණ චක්‍රලේඛය බලන්න.

**විකල්ප ක්‍රමවේදය යටතේ වන්දි ලබා දෙන්නේ කවුරුන් විසින්ද?**
අදාල අනතුර සිදුකළ මෝටර් වාහනය රක්ෂණය කර ඇති රක්ෂණ ආයතනය විසිනි. ඒ අනුව අදාල අනතුර සිදුකල මෝටර් වාහනයට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ලියාපදිංචි සාමාන්‍ය රක්ෂණ ආයතනයකින් නිකුත් කරන ලද, අවම වශයෙන් තුන්වන පාර්ශවීය මෝටර් වාහන රක්ෂණයක් තිබීම අනිවාර්ය වේ.

**වන්දි ලබා ගැනීමට අයදුම් කරන්නේ කෙසේද?**
ඉහත චක්‍රලේඛයෙහි අඩංගු අයදුම්පත සම්පූර්ණ කර එහි නියම කර ඇති ලේඛනද සමඟ අදාල අනතුර සිදුකළ මෝටර් වාහනය රක්ෂණය කර ඇති රක්ෂණ ආයතනය වෙත අදාල මරණය හෝ ස්ථිර අබලතාවය සිදුවී මාස 6ක් ඇතුලත ඉදිරිපත් කළ යුතුය.

**වන්දි ගෙවීම සිදුවන්නේ කෙසේද?**
අදාල වින්දිතයාට හෝ ඔහුගේ/ඇයගේ නීත්‍යානුකූල උරුමකරුවන්ට වන්දි ගෙවීම් සිදු කරන අතර මරණයකදී, රුපියල් ලක්ෂ පහක් (රු. 500,000/-) ද ස්ථිර අබලතා තත්වයකදී, රුපියල් ලක්ෂ පහක (රු. 500,000/-) උපරිමයක් දක්වාද ඉහත දක්වා ඇති චක්‍රලේඛයෙහි සඳහන් සීමාවන්ට යටත්ව ගෙවීම් සිදු කරනු ලැබේ.

**වන්දි ලබා ගැනීමට අදාල කොන්දේසි මොනවාද?**
පූර්ව කොන්දේසියක් ලෙස, මරණය හෝ අබලතා තත්වයට පත්වීම මෝටර් වාහන අනතුරේ ප්‍රතිඵලයක් නිසා සිදුවිය යුතු අතර, අනතුර සිදුවී මාස 12ක් ඇතුළත, මරණය හෝ ස්ථිර අබලතාවයට පත්වීම හෝ පත්වීම ආරම්භ වීම සිදුවිය යුතුය. තවද, මරණය හෝ ස්ථිර අබලතා තත්වයට පත්වීමෙන් මාස 6ක් ඇතුළත අදාල රක්ෂණ ආයතනයට වන්දි අයදුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම අදාල පාර්ශවයන් විසින් සිදු කළ යුතු වේ.

**වන්දි ලබා ගැනීමෙන් පසු නැවත අධිකරණයට යා හැකිද?**
ඔව්. වින්දිතයෙකුට හෝ ඔහුගේ/ඇයගේ නීත්‍යානුකූල උරුමකරුවෙකුට මෙම ක්‍රමය යටතේ ලබාගත් වන්දි මුදල ප්‍රමාණවත් නොවන අවස්ථාවක, නිසි වන්දි මුදලක් ලබා ගැනීම සඳහා අධිකරණයක් වෙත නඩුකරයක් ගොනු කිරීමේ හැකියාව ඇත.

මෙම විකල්ප වන්දි ක්‍රමවේදය පිළිබඳව සම්පූර්ණ තොරතුරු ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2024 අංක 3 දරණ චක්‍රලේඛයෙහි සඳහන් වන අතර, එය **www.ircsl.gov.lk** යන වෙබ් අඩවියෙන් ලබාගත හැක. ඔබට මේ පිළිබඳව වැඩිදුර තොරතුරු **011-2396188** යන ක්ෂණික දුරකථන අංකය ඔස්සේ ලබා ගත හැක.


**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**
11 වන මහල, නැගෙනහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01

| | |
|---|---|
| වෙබ්: www.ircsl.gov.lk | ඊ මේල් : info@ircsl.gov.lk |
| දු.ක. : 011 2396184 - 9 | ෆැක්ස්: 011 2396190 |


**19/03/2024**